# ටැම්පිට විහාර තුළින් අනාවරණය වන සම කාලීන මානවයාගේ සමාජ මට්ටම (පඬුවස්නුවර ටැම්පිට විහාරය ආශ්‍රිත අධ්‍යයනයකි)

**ආර්.එම්.එම්. රාජපක්ෂ**
අභයගිරි විහාර ව්‍යාපෘතිය, මධ්‍යම සංස්කෘතික අරමුදල, අනුරාධපුරය.
mangalikarajapaksha90@gmail.com

ප්‍රමුඛ පදඃ ටැම්පිට විහාර, වාස්තුවිද්‍යා, සංවර්ධන

## හැඳින්වීම

ටැම්පිට විහාර වූ කලී ශ්‍රී ලාංකේය වාස්තුවිද්‍යා සම්ප්‍රදායේ වැදගත් පරිණාමීය අවස්ථාවක් පිළිඹිබු කරන්නකි. දෙමහල් වාස්තුවිද්‍යා සැලසුම් මෙම සම්ප්‍රදායේ වඩා පරිණත අවස්ථාවක් නිරූපණය කරන බව පෙනේ. සමස්තයක් වශයෙන් ගත්කල වාස්තුවිද්‍යා ශෛලිය අනුව තනි මහල් ටැම්පිට විහාර සැලසුම් අතර ද්විත්ව ගොඩනැගිලි සැලසුම් වශයෙන් හඳුනාගත හැකි පඬුවස්නුවර ටැම්පිට විහාරයආශ්‍රය කරගනිමින් සමකාලීන මානවයාගේ නිර්මාණශීලීත්වය, තාක්ෂණය, කලාව, චින්තනය ආශ්‍රිත සංවර්ධන මට්ටම තුළින් සමාජය කෙරෙහි විග්‍රහයක් සිදු කිරීම මෙහි අරමුණයි.

## ක්‍රමවේදය

උක්ත පර්යේෂණය සිදු කිරීමේ දී මූලික වශයෙන් දත්ත රැස්කිරීමේ ක්‍රමවේද ලෙස පුස්තකාල ගවේශනය, ක්ෂේත්‍ර අධ්‍යයනය, ඡායාරූප ලබා ගැනීම යන ක්‍රමවේදයන් භාවිත කරන ලදී. හඳුනාගන්නා ලද දත්ත විශ්ලේෂණය කරමින් සමකාලීන සමාජය සම්බන්ධයෙන් අදහසක් දීමට බලාපොරොත්තු වේ.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

ශ්‍රී ලාංකේය බෞද්ධ විහාරාරාම ඉතිහාසයේ අනුරාධපුර හා පොළොන්නරු යුගවලට අයත් සැලසුම්කරණය තුළ පූජනීය අවශ්‍යතා සඳහා පිළිම ගේ ආකෘතිය සඳහා විශේෂ ස්ථානයක් ලැබුණි. ඒ අනුව, ලක්දිව ප්‍රතිමා ගෘහ නිර්මාණ සම්ප්‍රදායන් රැසක් වර්ධනය වීම හඳුනා ගත හැකිය. ඒවා,

- ගන්ධකුටි සම්ප්‍රදාය
- ගෙඩිගේ සම්ප්‍රදාය
- ටැම්පිට විහාර සම්ප්‍රදාය
- ලෙන් විහාර

යනුවෙන් හඳුන්වා දිය හැකිය. මහනුවර යුගයේ දී පිළිම ගේ අවශ්‍යතාව විහාරාරාම සංකීර්ණයක් තුළ ඉටුකර ගැනීමේ දී එතෙක් පැවති ආකෘතිය වෙනසකට භාජනය වී ඇති බව පෙනේ. එහි දී විහාරාරාම සංකීර්ණයේ පිළිම ගේ කාර්ය සඳහා වෙන් වූයේ ටැම්පිට නමින් ප්‍රචලිත

ගෘහ නිර්මාණය සඳහාය. ඊට අමතරව සාමාන්‍ය ප්‍රතිමා මන්දිර හා ලෙන් විහාරද නිර්මාණය විය. බුදුරජාණන් වහන්සේට ගෞරවයක් වශයෙන් ටැම්පිට විහාර බිහි වන්නට ඇතැයි සිතිය හැකිය. දැව තාක්ෂණය උපරිම ප්‍රාගුණ්‍යතාවකින් ප්‍රයෝජනයට ගෙන අලංකාර සියුම් කැටයමින් හෙබි, බුදුන් වහන්සේ සඳහා ඉදිවුණු කුටියක් වශයෙන් මෙම ටැම්පිට විහාර භාවිතයේ පැවති බව අනුමාන කළ හැකිය.

මෙම ගොඩනැගිලි විශේෂයෙහි ප්‍රභවය පිළිබඳ සැලකීමේ දී මත කිහිපයක් ඉදිරිපත් වී ඇති අතර එයින් වඩාත් පිළිගැනීමට ලක්ව ඇත්තේ හිටපු පුරාවිද්‍යා කොමසාරිස්වරයෙකු වූ චාල්ස් ගොඩකුඹුරගේ මතයයි. මුලින්ම දෙමහල්ව තිබූ විහාර පසුව ටැම්පිට විහාර බවට පරිවර්තනය වූ බව සඳහන් කරමින් මහනුවර මැදවල විහාරය හා මාවනැල්ල අම්බුලුගල විහාරය ඒ සඳහා උදාහරණ ලෙස ඔහු ඉදිරිපත් කරයි. ඒ හැර පොළොන්නරු යුගයේ අටදාගේ, හැටදාගේ වැනි ගොඩනැගිලිවලින්ද එය තහවුරු වේ. දළඳා මාළිගාවල ඉතිහාසය බලන කළ ඒ සඳහා යොදාගෙන ඇත්තේද මහල් ගොඩනැගිලි ආකෘතියකි. දඹදෙණියේ දළඳා මැදුර දෙමහල් ගොඩනැගිල්ලකි.

වර්ෂාධික නිවර්තන කලාපීය රටවල වේයන් ආදී කෘමීන්ගෙන් දැව ගොඩනැගිලි ආරක්ෂා කර ගැනීම සඳහා ගල් කණු මත ගොඩනැගිලි ඉදි කිරීමේ සිරිත පවතී.ශ්‍රී ලංකාවේ වී අටු, ගල් කණු මත ඉදි කරන්නේ ධාන්‍ය වේයන්ගෙන් හා තෙතමනයෙන් ආරක්ෂා කර ගැනීම සඳහාය. ටැම්පිට විහාරගෙවල් ඉදි කිරීමට පෙර ගල් ටැම් මත හෝ ගල් ගෙඩි මත හරහට බාල්ක දමා අම්බලම් වැනි ගොඩනැගිලි ඉදිකිරීම පැවතුණි. ගල් ගෙඩි මත තිබූ වී අටු පසු කාලීන ව උස් ගල් කණ මත හරහට දැව බාල්ක යොදා සාදන ලදී. මෙසේ ධාන්‍ය ආරක්ෂා කර ගැනීම සඵල වූ අතර ටැම්පිට ප්‍රතිමා ගෘහ සඳහා මෙම පරිණාමයද බලපාන්නට ඇති බව ගොඩකුඹුර ඇතුළු විද්වත්හු පවසති. කුඩා විහාර මන්දිරයකට ගාම්භීර පෙනුමක් ලබා දීමට ද මේ ආකාරයේ උස් ගල් කණු මත විහාර මන්දිරය ඉදි කරන්නට ඇති බවට තවත් අදහසක් පවතී.

ඓතිහාසික නිර්මාණයක් ඔස්සේ සමකාලීන මානවයාගේ සමාජ මට්ටම සම්බන්ධයෙන් අංශ කිහිපයක් යටතේ අවධානය යොමු කළ හැකි ය. ටැම්පිට විහාරගෙය ඉදිකිරීමේ දී භාවිත කර තිබෙන තක්ෂණික ක්‍රමවේදයන් විමසා බැලීමේ දී එය පුළුල් පරාසයකට විහිදී යන තරමේ මාතෘකාවකි. එහි දී එක් එක් කොටස් යටතේ මෙම සමස්ත නිර්මාණයේම තාක්ෂණික හා වාස්තු විද්‍යාත්මක ක්‍රමවේදයන් අධ්‍යයනය කිරීම සිදු නොවන අතර මෙම තාක්ෂණික ශිල්ප ක්‍රම මගින් එවකට තිබූ තාක්ෂණය කොපමණ ද යන්න වටහා ගැනීමට තරම් සාධක සැපයිය හැකි ය. සමකාලීන මානවයාගේ නිර්මාණ, ද්‍රව්‍ය,ඉඩ සැලසුම්කරණ තාක්ෂණය හා වාස්තු විද්‍යාත්මක ශිල්පීය ඥානය කෙබඳු ද යන්න එමගින් ඔප්පු

කරගත හැකිය. ඉදිරියේ ම ඇති හේවිසි මණ්ඩපය, ප්‍රතිමා ගෘහය, ප්‍රතිමාව, ඇතුළත හා පිටත සිතුවම්, ලී තරප්පු පෙළ, දැව කණු හා දැව කැටයම්, ගෙ බිම, වහලය, අත්වැට ආදී ටැම්පිට විහාර ගෙයි සියලු ම වාස්තුවිද්‍යාත්මක නිර්මාණ ද්‍රව්‍ය තාක්ෂණය හා නිර්මාණ තාක්ෂණය යටතේ සාකච්ඡා කළ හැකි අතර ඒ තුළින් සමාජ මට්ටට පිළිබඳ ව අවබෝධයක් ලබාගත හැකි ය.

මහනුවර යුගය පමණ වනවිට ශිලා කර්මාන්ත බොහොමයක් ම පාහේ අභාවයට ගිය ආකාරයක් හඳුනාගත හැකි ය. එයට ආදේශක වශයෙන් මැටි යොදාගෙන ගෘහනිර්මාණ කටයුතු සිදු කරන ලදී. මැටි බිත්තියෙහි අඳින ලද සිතුවම් ජලය උරාගැනීම හේතු කොටගෙන ඉක්මනින් විනාශවන ආකාරය හඳුනාගත් ශිල්පීහු ඊට විකල්ප වශයෙන් ද දේශගුණික විපර්යාස හා සත්ත්ව උවදුරු හේතුවෙන් ද ගල්තලා මත විහාර සාදා එහි සිතුවම් ඇඳීම ආරම්භ කරන්නට ඇත. ඔවුන් පරිසරය තුළින්ම ඉගෙන ගනිමින් එහි ජීවත්වීමේ කලාවක්, රිද්මයක් පුරුදු පුහුණු වී සිටියහ.

අටුව (වී බිස්ස), අම්බලම් සඳහා ද ටැම්පිට විහාර තාක්ෂණය ම යොද ගත්ත ද මෙම නිර්මාණ තුනෙන් ම සිදුවන්නේ එකිනෙක වෙනස් වු කාර්යයන් ය. මන්ද විවිධ වු කාර්යයන් සඳහා නිර්මාණය කරන ලද නිර්මාණවලට පාරිසරික හේතු කාරණා මත එකම තාක්ෂණික ශිල්ප ක්‍රමයක් භාවිත කිරීම සාධාරණ ය.

මෙහි දී පැන නඟින ගැටලුව වන්නේ විහාර ගෙවල් ආරක්ෂා කර ගැනීමේ අභිලාශය පැවතියේ මහනුවර යුගයේ මිනිසුන්ට පමණක් ද යන්න ය. ටැම්පිට විහාර සම්ප්‍රදාය මහනුවර යුගයේ බිහිවන්නේ විහාර ගෙය හා එයට අදාළ අංග ආරක්ෂාකාරී ලෙස පවත්වාගෙන යාමේ ඒකායන පරමාර්ථයම මත මෙකී නිර්මාණයන් බිහි වුවා යැයි සිතීම සාධාරණ නොවේ. යම් නිර්මාණයක් සිදු කරනු ලබන්නේ යටි යුගයක හෝ කාල වකවානුවක ජීවත් වූපිරිසකගේ ආභාසයෙනි. අප තේරුම් ගතයුතු මූලික කරුණ වන්නේ යටි නිර්මාණයක් කිරීමට පාදක වූ මානුෂීය සංකල්පනාවක් හා ඔවුන්ට මුහුණපෑමට සිදු වූ ජීවන අභියෝගයන් පිලිබදව ය.

ටැම්පිට විහාරය මඟින් සම්පූර්ණ වූ තාක්ෂණික හා ආරක්ෂිත ක්‍රමවේදයන් අනෙකුත් මුල් යුගයන්ගේ ප්‍රතිමාගෘහ මෙන් තිබේ යැයි අපට එකහෙලා ප්‍රකාශ කල නොහැකිය. එයට හේතුව මහනුවර යුගය වන විට රජවරුන්ට ප්‍රහල වූ විදේශ ආක්‍රමණවලට මුහුණදීමට සිදු වූ කාලයකී. ඔවුන්ගේ මූලික අරමුණ වන්නේ තමන්ගේ රාජ්‍ය බේරාගෙන දිවි ගලවාගෙන හෝ සේනා සංවිධානය කර ප්‍රහාර එල්ල කිරීම විය හැකිය. ඒ සඳහා එම යුගයේ රජවරුන්ට විශාල මූල්‍යමය කොටසක් ඒ සඳහා යෙදවීමට සිදුවුවා විය හැකිය. එසේ නම් බෞද්ධාගමික පුනර්ජීවනය උදෙසා ඔවුන්ගේ දායකත්වය පිළිබදව ඔවුන්ට දෙවරක් සිතා බැලීමට සිදු වේ. එබැවින් ඉතා විශාල ප්‍රමාණයේ

එනම් අනුරාධපුර, පොලොන්නරු යුගවලට මෙන් විශාල ප්‍රතිමා ගෘහ, විශාල බිත්ති ගඩොළු බිත්ති සහිත ගෙඩිගේ සම්ප්‍රදායේ ප්‍රතිමා ගෘහ නිර්මාණය කිරීමට තරම් මුල්‍යමය හා ශ්‍රමය වැය කිරීමට නොහැකි වුවා විය හැකිය. එබැවින් ඔවුන් ඉහත කුඩා ප්‍රමාණයේ ටැම්පිට විහාර සම්ප්‍රදායේ ප්‍රතිමා ගෘහ නිර්මාණයට පෙලඹෙන්නට අත. එය ඉතා ජනප්‍රිය කලාවක් ලෙස ඉන්පසුව වැළඳ ගැනීම නිසාවෙන් විශාල ටැම්පිට විහාර ප්‍රමාණයන් ලංකාවේ මහනුවර යුගය තුළ ඉදි වන්නට ඇත.

මහනුවර යුගයේ මෙරට රාජ්‍ය පාලන තන්ත්‍රයේ තිබූ සංවර්ධනීය මට්ටම මත එකල බුද්ධ ශාසනය උදෙසා කළනිර්මාණයන්ගේ තත්වයන් අඩු වැඩි වශයෙන් එකිනෙකට ගැළපීම සිදු වුවා විය හැකිය. එවකට ඉදි වූ ටැම්පිට විහාර මඟින් එම කාලයේ සංවර්ධන මට්ටමත්, එම කාලයේ සංවර්ධන මට්ටම ටැම්පිට විහාර ප්‍රතිමා ගෘහ මතිනුත්එකිනෙකට එක්වෙමින් ගොඩ නැගෙන්නට ඇත.

### ආශ්‍රිත ග්‍රන්ථ

ගුණවර්ධන, ප්‍රිශාන්ත (2009), පුරාවිද්‍යාව ශ්‍රී ලංකාවේ බහු ජාතික එකමුතුව සහ වාස්තුවිද්‍යා උරුමය, ඇස්. ගොඩගේ සහ සමාගම, කොළඹ.

විජයවර්ධන, කුසුම්සිරි (2010), ශ්‍රී ලංකාවේ ටැම්පිට විහාර, දයාවංශ ජයකොඩි සහ සමාගම, කොළඹ.

Chandrasekara, D.P. (2002), Architecture of Tampita viharas in Sri Lanka(image house on stone pillars),author Publication.